# අධිවචන දුකයේ ස්වරූපාර්ථ ගැනීම

<u>නික්ඛේප කාණ්ඩ පාළිය</u> - 1313. කතමෙ ධම්මා අධිවචනා? යා තෙසං තෙසං ධම්මානං සඞ්ඛා සමඤ්ඤා පඤ්ඤත්ති වොහාරො නාමං නාමකම්මං නාමධෙය්‍යං නිරුත්ති බ්‍යඤ්ජනං අභිලාපො – ඉමෙ ධම්මා අධිවචනා. සබ්බෙව ධම්මා අධිවචනපථා.

<u>අටුවා පාඨය</u> - 1313. **අධිවචනදුකනිද්දෙසෙ යා තෙසං තෙසං ධම්මානන්ති** සබ්බධම්මග්ගහණං. **සඞ්ඛායතීති සඞ්ඛා,** සංකථීයතීති අත්ථො. කින්ති සංකථීයති? **අහන්ති** මමන්ති පරොති පරස්සාති සත්තොති භාවොති පොසොති පුග්ගලොති නරොති මාණවොති තිස්සොති දත්තොති, 'මඤ්චො පීඨං භිසි බිම්බොහනං' 'විහාරො පරිවෙණං ද්වාරං වාතපාන'න්ති එවං අනෙකෙහි ආකාරෙහි සංකථීයතීති 'සඞ්ඛා'. **සමඤ්ඤායතීති සමඤ්ඤා.** කින්ති සමඤ්ඤායති? 'අහන්ති…පෙ… වාතපාන'න්ති සමඤ්ඤායතීති 'සමඤ්ඤා'. **පඤ්ඤාපියතීති පඤ්ඤත්ති. වොහරියතීති වොහාරො.** කින්ති වොහරියති? 'අහ'න්ති…පෙ… 'වාතපාන'න්ති වොහරියතීති වොහාරො. - නික්ඛේප කාණ්ඩ අටුවාව

<u>මූලටීකාව</u> - 1313. **අහන්ති** ඉති-සද්දපරෙන <u>අහං-සද්දෙන</u> හෙතුභූතෙන යො අත්ථො විඤ්ඤායති, සො සංකථීයති, උදීරීයතීති අත්ථො. **අඤ්ඤථා** හි වුච්චමානස්ස වචනෙන පකාසියමානස්ස පදත්ථස්ස **සඞ්ඛාදිභාවෙ සබ්බෙසං** කුසලාදිධම්මානං අධිවචනාදිතා සියාති. **භාවොති** සත්තවෙවචනන්ති භණන්ති, ධාතුයා වා එතං අධිවචනං. **දත්තොති** එත්තාවතා සත්තපඤ්ඤත්තිං දස්සෙත්වා අඤ්ඤම්පි උපාදාපඤ්ඤත්තිං දස්සෙතුං **"මඤ්චො"**තිආදිමාහ. අහන්ති ච පවත්තං අධිවචනං වදන්තෙන සුණන්තෙන ච පුබ්බෙ ගහිතසඤ්ඤෙන අත්ථප්පකාසනභාවෙන විඤ්ඤායති. න හි තස්මිං අවිඤ්ඤාතෙ තදත්ථවිජානනං අත්ථීති විසෙසෙන අධිවචනං **"ඤායතීති සමඤ්ඤා"**ති වුත්තං. එතස්සත්ථස්ස අහන්ති ඉදං අධිවචනන්ති එවං වා සඤ්ඤාගහණවසෙන ඤායති සමඤ්ඤායති පාකටා හොතීති **සමඤ්ඤා.**

<u>මූලටීකා සන්නය</u> - 1313. **අහන්ති** - අහං යනු; **ඉති-සද්දපරෙන** - පසුව 'ඉති' ශබ්දය ඇත්තා වූ; **හෙතුභූතෙන** - හේතු වන්නා වූ; **අහං-සද්දෙන** - 'අහං' ශබ්දය හේතුවෙන් (අට්ඨකථාවේ පැමිණි 'අහං' ශබ්දය හේතුවෙන්); **යො අත්ථො** - යම් 'අහං' යන අර්ථය; **විඤ්ඤායති** - දැන ගනු ලබන්නේ ද; **සො** - ඒ 'අහං' යන අර්ථය; **සංකථීයති** - මනාව කියනු ලැබේ. **උදීරීයති** - උද්ධරණය කරනු ලැබේ; **ඉති** - යන; **අත්ථො** - අර්ථ යි. **හි** - ලද්ධ දෝෂය දක්වන්නෙමි; **අඤ්ඤථා** - කියන ලද අර්ථයෙන් වෙනත් ආකරයෙන්; (අත්ථෙ ගය්හමානෙ); **වුච්චමානස්ස** - කියන ලද; **වචනෙන** - වචනයෙන්; **පකාසියමානස්ස** - ප්‍රකට කරන්නා වූ; **පදත්ථස්ස** - පදයාගේ අර්ථයගේ ('අහං' යන පදයාගේ අර්ථය වන ස්කන්ධ පඤ්චක ද්‍රව්‍යයාගේ); **සඞ්ඛාදිභාවෙ** - සඞ්ඛා යන ආදීන්ගේ භාවය; (සති - ඇති කල්හි) ('අඤ්ඤථා' පදය විස්තර කොට විවරණය කිරීම යි. 'ආදි' පදයෙන් සමඤ්ඤා, පඤ්ඤත්ති ආදිය ගනියි); **සබ්බෙසං කුසලාදිධම්මානං** - සියලු කුසල ආදී ධර්මයන්ගේ; **අධිවචනාදිතා** - අධිවචන ආදී භාවය; **සියා** - වන්නේය ('ආදි' පදයෙන් නිරුත්ති, පඤ්ඤත්ති පදයන් ගනියි); **ඉති** - යන; (අත්ථො විඤ්ඤායති) ***('අහං' යන ශබ්දය නොගෙන 'මම' යැයි කියනු ලබන සත්වපුද්ගල අර්ථය ගතොහොත් කවරක් වේ ද යැයි දැක්වීමට මෙහි "අඤ්ඤථා" යන වාක්‍යය දැක්වේ. ශබ්දය 'සඞ්ඛා' ආදී වශයෙන් නොගෙන ඒ ශබ්දයෙන් දක්වන්නා වූ 'මම' යැයි කියනු ලබන ස්කන්ධපඤ්චක අර්ථය ගතහොත අධිවචන පදයේ ස්වරූපාර්ථ සඳහා ශබ්දය නොගෙන කුසල ආදී ධර්මයන් ම ලැබේ. එබැවින් අධිවචන සහ අධිවචනපථ යන පදයන්ගේ ස්වරූපාර්ථයන්ගේ වෙනසක් නොමැති දුකයක් බවට පත්වේ යැයි අදහස් කෙරේ).***

**භාවොති** - භාවො යන ශබ්දය; **සත්තවෙවචනන්ති** - සත්වයන්ගේ පරියාය ශබ්දය යැයි; **භණන්ති** - කියත්. **වා** - වෙනත් ක්‍රමයකින්; **එතං** - මෙම භාව ශබ්දය; **ධාතුයා** - ධාතු සභාවයගේ; **අධිවචනං** - ප්‍රකාශ කරන ශබ්දය යි. **දත්තොති** - දත්තො යන; **එත්තාවතා** - යන මෙපමණක් වන වචනයෙන්; **සත්තපඤ්ඤත්තිං** - සත්ව ප්‍රඥප්තිය; **දස්සෙත්වා** - දක්වා (අටුවාවෙහි පැමිණි 'අහං' පටන් 'දත්තො' දක්වා ඇති පාඨයෙන්); **අඤ්ඤම්පි** - සත්ව ප්‍රඥප්තියෙන් අන්‍ය වූ; **උපාදාපඤ්ඤත්තිං** - උපාදා ප්‍රඥප්තිය; **දස්සෙතුං** - දැක්වීමට; **"මඤ්චො"තිආදිමාහ** - මඤ්චො යන ආදිය සංගීතිකාරකයන් වහන්සේ වදාළහ.

**ච** - තව ද නොහොත් 'සඞ්ඛායති' පදයේ විවරණයෙන් අන්‍ය වූ 'සමඤ්ඤායති' පදයේ නිර්වචනය දක්වන්නෙමි; **අහන්ති** - 'අහං' යැයි; **පවත්තං** - වන්නා වූ; **අධිවචනං** - ශබ්දය; **වදන්තෙන** - කියන්නා වූ පුද්ගලයා විසින් ද; **සුණන්තෙන ච** - අසන්නා වූ පුද්ගලයා විසින් ද; **පුබ්බෙ** - වචනය බිඳීමට පෙර; **ගහිතසඤ්ඤෙන** - ගන්නා ලද සඤ්ඤා ඇති පුද්ගලයා විසින් (එම සඤ්ඤාව පකතූපනිස්සය ශක්තියෙන් උපකාරක වේ); (හුත්වා); **අත්ථප්පකාසනභාවෙන** - අර්සය ප්‍රකට කිරීම් භාවයෙන්; **විඤ්ඤායති** - දැනගනු ලැබේ. **හි** - සැබවි; **තස්මිං** - ඒ ශබ්දය; **අවිඤ්ඤාතෙ** - දැන ගැනීමට පෙර; **තදත්ථවිජානනං** - ඒ අර්ථය දැනගැනීමක්; **න අත්ථීති** - නැති බැවින්; **විසෙසෙන** - විශේෂයෙන්; **අධිවචනං** - ශබ්දය; **"ඤායතීති**

සමඤ්ඤ"ති - ඤායතීති සමඤ්ඤා යැයි (ඤායති - දැනගනු ලැබේ; ඉති - එබැවින්; සමඤ්ඤා - සමඤ්ඤා යැයි); වුත්තං - කියන ලදී. වා - වෙනත් ක්‍රමයකින්; අහන්ති ඉදං - 'අහං' යන මෙම ශබ්දය; එතස්සත්ථස්ස - මෙම අර්ථය; අධිවචනන්ති - ප්‍රකාශ කරන්නා වූ ශබ්දය ය; ඉති එවං - යැයි මෙසේ; සඤ්ඤාගහණවසෙන - සඤ්ඤා ග්‍රහණයේ ශක්තියෙන්; ඤායති - දැනගනු ලැබේ; සමඤ්ඤායති - පනවනු ලැබේ; පාකටා හොති - ප්‍රකට වේ; ඉති - එබැවින්; **සමඤ්ඤ** - සමඤ්ඤා නම් වේ.

<u>අනුටීකාව</u> - 1313. **අහං-සද්දෙන හෙතුභූතෙන යො අත්ථොති** එත්ථ අහං-සද්දො අත්ථොති අධිප්පෙතො. අත්ථාවබොධනත්ථො හි සද්දප්පයොගො. අත්ථපරාධීනො කෙවලො අත්ථපදත්ථකො, සො පදත්ථවිපරියෙසකාරිනා පන ඉති-සද්දෙන පරතො පයුත්තෙන සද්දපදත්ථකො ජායති යථා ගාවීති අයමාහාති ගො-සද්දං ආහාති විඤ්ඤායති. තෙන විඤ්ඤත්තිවිකාරසහිතො සද්දො පඤ්ඤත්තීති දස්සෙති. තථා හි "බුද්ධස්ස භගවතො වොහාරො ලොකියසොතෙ පටිහඤ්ඤතී"තිආදිනා (කථා· 347) පඤ්ඤත්තියා වචනභාවං සාධයති. **අඤ්ඤථාතිආදිනා** පඤ්ඤත්තියා අසද්දසභාවත්තෙ දොසමාහ. **අධිවචනාදිතා සියා,** තථා ච අධිවචනාදීනං අධිවචනපථාදිතො විසෙසො න සියාති දුකොයෙව න සම්භවෙය්‍යාති අධිප්පායො. අට්ඨකථායං පන සකසන්තතිපරියාපන්නෙ රූපාදයො ධම්මෙ සමූහතො සන්තානතො ච එකත්තවසෙන ගහෙත්වා අහන්ති වොහරියමානා උපාදාපඤ්ඤත්ති සඞ්ඛායති වොහරීයතීති සඞ්ඛාති අධිප්පෙතා. තථා සෙසෙසු යථාසම්භවං දට්ඨබ්බං. තෙනෙවාහ **"දත්තොති එත්තාවතා සත්තපඤ්ඤත්තිං දස්සෙත්වා අඤ්ඤම්පි උපාදපඤ්ඤත්තිං දස්සෙතු"**න්තිආදි. **පදත්ථස්සාති** අහං-සද්දාදිපදාභිධෙය්‍යස්ස, පරමත්ථස්ස වා.

<u>අනුටීකා පරිවර්තනය</u> - 1313. **අහං-සද්දෙන හෙතුභූතෙන යො අත්ථොති** එත්ථ - **අහං** - අහං සද්දෙන හෙතුභූතෙන යො අත්ථොති යන මෙහි; අහං-සද්දො - 'අහං' ශබ්දය; අත්ථොති - අර්ථය යැයි; අධිප්පෙතො - අදහස් කරන ලදී. හි - සැබවි; සද්දප්පයොගො - ශබ්ද ප්‍රයෝගය; අත්ථාවබොධනත්ථො - අර්ථය අවබෝධ කරවීමේ ප්‍රයෝජනය ඇත්තේය. **අත්ථපරාධීනො කෙවලො අත්ථපදත්ථකො,** සො පන - එය (අත්ථපදත්ථකො) වනාහි; පදත්ථවිපරියෙසකාරිනා - පද අර්ථය පෙරළන්නා වූ; ඉති-සද්දෙන - ඉති ශබ්දය සමඟ; පරතො පයුත්තෙන - පසුව යෙදීමෙන්; සද්දපදත්ථකො - ශබ්ද පද අර්ථ ඇති බවට; ජායති - පැමිණේ. යථා - යම් සේ; ගාවීති - ගාවී යැයි; අයමාහාති - මොහු කීය යනු; ගො-සද්දං ආහාති - 'ගො' ශබ්දය කීවේය යැයි; විඤ්ඤායති - දැන ගනු ලැබේ. තෙන - එයින්; විඤ්ඤත්තිවිකාරසහිතො - විඤ්ඤත්ති විකාර සහිත වූ; සද්දො - ශබ්දය; පඤ්ඤත්තීති - ප්‍රඥප්තිය යැයි; දස්සෙති - දක්වයි. තථා හි - ආගම දළ්හීකරණය වනාහි; "බුද්ධස්ස භගවතො වොහාරො ලොකියසොතෙ පටිහඤ්ඤතී"තිආදිනා (කථා· 347) - "බුද්ධස්ස භගවතො වොහාරො ලොකියසොතෙ පටිහඤ්ඤතී"තිආදිනා යන ආදියෙන්; පඤ්ඤත්තියා - ප්‍රඥප්තියගේ; වචනභාවං - වචන භාවය; සාධයති - සාධනය කරවයි. **අඤ්ඤථාතිආදිනා** - අඤ්ඤථා යන ආදියෙන්; පඤ්ඤත්තියා - ප්‍රඥප්තියගේ; අසද්දසභාවත්තෙ - අශබ්ද ස්වභාවය භාවයෙහි; දොසමාහ - දෝෂය දැක්වීය. **අධිවචනාදිතා සියා** - අධිවචන භාවය ද වන්නේය, ච - තවද; තථා - එසේ; අධිවචනාදීනං - අධිවචන ආදීන්ගේ; අධිවචනපථාදිතො - අධිවචනපථ ආදී වශයෙන්; **විසෙසො න සියා** - විශේෂයක් නොවන්නේය; ඉති - යැයි; දුකොයෙව - දුකයක් ම; න සම්භවෙය්‍යා - හට නොගන්නේය; ඉති - යන; අධිප්පායො - අදහසයි. අට්ඨකථායං පන - අටුවාවෙහි වනාහි; සකසන්තතිපරියාපන්නෙ - ස්වකීය සන්තතියට ඇතුලත් වන්නා වූ; රූපාදයො ධම්මෙ - රූප ආදී ධර්මයන්; සමූහතො - සමූහ ලෙස ද; සන්තානතො ච - සන්තාන ලෙස ද; එකත්තවසෙන - ඒකත්ව වශයෙන්; ගහෙත්වා - ගෙන; අහන්ති - 'අහං' යැයි; වොහරියමානා - ව්‍යවහාර කරනු ලබන්නේ; උපාදාපඤ්ඤත්ති - උපාදාපඤ්ඤත්තිය; සඞ්ඛායති - කියනු ලැබේ; වොහරීයති - ව්‍යවහාර කරනු ලැබේ; ඉති - යැයි; සඞ්ඛාති - සඞ්ඛා යැයි; අධිප්පෙතා - අදහස් කරන ලදී. තථා - එසේ; සෙසෙසු - සෙසු තැන්හි; යථාසම්භවං - යම් සේ ලැබෙන පරිදි; දට්ඨබ්බං - දතයුතු ය. තෙන එව - එහෙයින් ම; **"දත්තොති එත්තාවතා සත්තපඤ්ඤත්තිං දස්සෙත්වා අඤ්ඤම්පි උපාදපඤ්ඤත්තිං දස්සෙතු"**න්තිආදි - දත්තොති එත්තාවතා සත්තපඤ්ඤත්තිං දස්සෙත්වා අඤ්ඤම්පි උපාදාපඤ්ඤත්තිං දස්සෙතු යන ආදිය; ආහ - ටීකාවේ දැක්වීය. **පදත්ථස්සාති** - පදත්ථස්ස යනු; අහං-සද්දාදිපදාභිධෙය්‍යස්ස - අහං ශබ්දයාගේ අභිධෙය්‍යාර්ථය ය. වා - නොහොත්; පරමත්ථස්ස - පරමර්ථයාගේ ය.